# ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

# 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (අයදුම්පත් ආදර්ශය දක්වා ඇත.)

**(අ) භාණ්ඩ**

01. කාර්යාලීය ලිපිද්‍රව්‍ය (පරිගණක ලිපිද්‍රව්‍ය ඇතුළුව)

02. කාර්යාලීය උපකරණ
   - i ලී බඩු උපකරණ හා වානේ ගෘහ භෘණ්ඩ
   - ii පරිගණක යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ආදිය
   - iii වායු සමීකරණ යන්ත්‍ර
   - iv ගිනි නිවීමේ උපකරණ

03. පරිගණක මෘදුකාංග හා අනෙකුත් පරිගණක උපාංග, මුද්‍රණ යන්ත්‍ර උපාංග (ටෝනර්/ කාට්රිජ්/ රිබන්)

04. වෙබ් අඩවි නිර්මාණය, පරිගණක ජාලකරණය

05. නිල ඇඳුම් සඳහා රෙදි

06. මෝටර් රථ අමතර කොටස් (බැටරි, ටයර් හා ටියුබ් ඇතුළුව)

07. සෞඛ්‍ය කටයුතු සඳහා අවශ්‍ය
   - i විෂබීජ නාශක හා සේදුම් ද්‍රව්‍ය
   - ii ඉදල්, කොසු, රේක්ක, බාල්දි ආදී උපකරණ

08. වීථි පහන් උපකරණ හා විදුලි උපාංග

09. ක්‍රීඩා උපකරණ

10. ගම් බූට්ස්, වැහි කබා, ලෙදර් බෑග් ආදිය

11. ඉදිකිරීම් ද්‍රව්‍ය
   - i ගල්, වැලි, පස් ආදිය
   - ii පෙර නිමි කොන්ක්‍රීට් නිෂ්පාදන (හියුම් පයිප්ප/ කොන්ක්‍රීට් කුට්ටි ගල් ආදිය)
   - iii සියළුම හාඩ්වෙයාර් අයිතම

12. උදෑසන ආහාර, දිවා ආහාර හා බේකරි ආහාර

**(ආ) සේවා**

01. සියළුම මුද්‍රණ සේවා (පොත් බැඳීම ඇතුළුව)

02. පරිගණක යන්ත්‍ර, ෆැක්ස්, ඡායාපිටපත් යන්ත්‍ර ඇතුළු යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම

03. සියළුම වාහන සේවා කිරීම හා වාහන අලුත්වැඩියා කිරීම

04. වාහන කුලියට සැපයීම (ත්‍රීරෝද රථ, වෑන්, ටිපර්, ට්‍රැක්ටර්, බැකෝ යන්ත්‍ර ආදිය

05. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම

06. පුවත්පත් දැන්වීම් පල කිරීම

07. අනතුරුදායක ගස් ඉවත් කිරීම.

08. ඉදිකිරීම් සඳහා ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන වැඩිහිටි සමිති, ගොවි සංවිධාන ආදිය

**ආදර්ශ අයදුම්පත**

## 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත

01. ව්‍යාපාරික නාමය හා ලිපිනය :- ..........................................................................................

02. ලියාපදිංචි අංකය හා දිනය :- ..........................................................................................

03. ලියාපදිංචිය අපේක්ෂා කරන අයිතමය :- ..........................................................................................

04. දුරකථන අංකය හා ෆැක්ස් අංකය :- ..........................................................................................

05. බැංකුවේ නම හා ලියාපදිංචි අංකය :- ..........................................................................................

06. මෙම ආයතනයට ලබා දිය හැකි නය පහසුකම් :- ..........................................................................................

කාලසීමාව :- ..........................................................................................

වටිනාකම :- ..........................................................................................

07. 2025 වර්ෂයේ භාණ්ඩ හා සේවා සැපයූ රාජ්‍ය ආයතනවල ලැයිස්තුවක් :- ......................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

08. ලියාපදිංචි ගාස්තු ගෙවනු ලබන්නේ මුදලින්ද, චෙක්පත් මගින්ද යන්න (චෙක්පත් මගින් නම් චෙක්පත් අංකය හා දිනය සඳහන් කරන්න)

........................ ......................................

දිනය අත්සන ( මුද්‍රාව සහිත)

01. ඉහත ආකෘතිය අනුව සකස් කර ගත් අයදුම්පත් 2026.06.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක.

02. ලියාපදිංචි එක් සැපයීම් අයිතමයක් සඳහා රුපියල් 250.00 ක මූලික ගාස්තුවක් හා කොන්ත්‍රාත් සමිතියක් ලියාපදිංචි වීම වෙනුවෙන් රුපියල් 500.00 ද වශයෙන් අදාල ගාස්තු චෙක්පත් මගින් හෝ පැමිණ මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් මගින් ගෙවීමේ දී **"සභාපති, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව"** නමින් චෙක්පත එවිය යුතුය.

03. තැපෑලෙන් එවනු ලබන සියළුම අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම්පස **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026"** යනුවෙන් සඳහන් කළ යුතුය.

04. ඉල්ලුම් කළ පසු ලංසු ඉදිරිපත් නොකරන, ඇණවුම් කළ පසු නියමිත පරිදි භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

05. ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් අවශ්‍ය පරිදි ලංසු කැඳවනු ලබන අතර, අවශ්‍යතා අනුව වෙනත් බාහිර සැපයුම්කරුවන්ගෙන්ද ලංසු කැඳවා මිලදී ගැනීම් හා සේවා ලබා ගැනීමේ අයිතිය ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතුවේ.

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වන සැපයුම්කරුවන් සඳහා තිබිය යුතු නිර්නායක :-**

i සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය

ii තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරීමේ සහතිකය

iii සමාගමක් නම්සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය

iv මීට පෙර භාණ්ඩ හා සේවා සැපයූ රාජ්‍ය ආයතන පිළිබඳ විස්තර තහවුරු කරන ලේඛන එවිය යුතුය.

v වෙනත් විශේෂ සුදුසුකම් ඇත්නම් සඳහන් කරන්න.

සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
දුරකථන අංකය : 036-2258012/14